## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
## ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

## මාධ්‍ය නිවේදනය

### "ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අභිමතාර්ථ සහ දර්ශක පිළිබඳ තත්වය- 2017" වාර්තාව සහ වෙබ් අඩවිය දියත් කිරීම.

**දුරකථන: 011-2147086** **ෆැක්ස්: 011-2877932** **2017 ජූලි මස 26 දින**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් " ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අභිමතාර්ථ සහ දර්ශක පිළිබඳ තත්වය - 2017" නමින් වාර්තාවක් නිකුත් කරන ලද අතර ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අභිමතාර්ථ සහ දර්ශක පිළිබඳකාලීන තොරුතුරු පල කිරීම සඳහා වෙබ් අඩවියක් ද දියත් කරන ලදී.

එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින්, දිළිඳුකම පිටුදැකීම, පෘථිවිතලය රැක ගැනීම සහ සැමට සෞභාග්‍ය උදාකරදීම මූලික කර ගනිමින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයෙහි අංගයක් ලෙස 2015 වර්ෂයේ දී තිරසර සංවර්ධන අභිමතාර්ථයන් එළිදක්වන ලදී.

තිරසර සංවර්ධනය සඳහා න්‍යාය පත්‍රය "අපගේ ලෝකය වෙනස් මගකට යොමු කිරීම" ප්‍රකාශනය මගින් එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් විසින් තිරසර සංවර්ධන අභිමතාර්ථ 17ක් හඳුන්වා දෙන ලද අතර ඒ සඳහා ඉලක්ක 169ක් ද හඳුනා ගන්නා ලදී. එම ඉලක්කයන් ලඟාකර ගැනීම මැන බැලීම සඳහා නිර්නායක 244ක් ද මේ වන විට හඳුනාගෙන තිබේ. එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල්වල සංවර්ධන න්‍යාය පත්‍රයන් මගින් තිරසර සංවර්ධන අභිමතාර්ථ සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබාදීම අපේක්ෂා කෙරේ.

තිරසර සංවර්ධන කටයුතු පිළිබඳව අමාත්‍යාංශයක් ස්ථාපනය කිරීම සහ ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධන අභිමතාර්ථ පිළිබඳ එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය සාර්ථකව ක්‍රියාවට නැංවීමට අදාල නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කමිටුවක් පිහිටුවීම මගින් තිරසර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමෙහි ලා ශ්‍රී ලංකා රජයේ කැපවීම මනාව පිළිබිඹු වේ. තිරසර සංවර්ධන අභිමතාර්ථ පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කමිටුව විසින් තිරසාර සංවර්ධන අභිමතාර්ථ පර්ෂද 4ක් යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත පොකුරු කමිටු 4ක් ද පිහිටුවා තිබේ.

" ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අභිමතාර්ථ සහ දර්ශක පිළිබඳ තත්වය - 2017 " වාර්තාවේ පළමු පිටපත ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මහතා විසින් තිරසාර සංවර්ධන අභිමතාර්ථ පිළිබඳ පාර්ලිමේන්තු තේරීම් කමිටුවේ සභාපති, ගරු නියෝජ්‍ය කතානායක තිලංග සුමතිපාල මහතා වෙත 2017 ජූලි මස 26 වන දින පාර්ලිමේන්තුවේ දී පිරිනමන ලදී. එම අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ

තිරසර සංවර්ධන අභිමතාර්ථ සහ දර්ශක පිළිබඳ වෙබ් අඩවිය ද ගරු නියෝජ්‍ය කතානායක තිලංග සුමතිපාල මහතා විසින් එළිදක්වන ලදී.

සංවර්ධන ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීමේ දී තිරසාර සංවර්ධන අභිමතාර්ථ සහ ඉලක්ක කළමනාකරණ ක්‍රම ශිල්පයක් බවට පත්කිරීමට සහ ඒ අනුව සම්පත් වෙන් කිරීම සඳහාත් තිරසර සංවර්ධන අභිමතාර්ථ නිර්නායක රාමුවක අවශ්‍යතාවය දැඩිලෙස පවතී. එමෙන්ම තිරසර සංවර්ධනය උදෙසා වැඩසටහන් සකස් කිරීම සඳහා මෙන්ම තිරසාර සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් විවිධ පාර්ශවයන්ගේ වගකීම තහවුරු කර ගැනීම සඳහා මාර්ගයක් සකස් කර ගැනීමේ නිර්නායක රාමුවක් වශයෙන් ද මෙම වාර්තාව යොදා ගත හැකිය.

මෙම වාර්තාව මගින් තිරසර සංවර්ධන අභිමතාර්ථ නිර්නායක රාමුවට අදාල දර්ශක 244ක් මත පදනම් ව දැනට සම්පදනය කළ හැකි දර්ශක වලට අදාල දත්ත පිළියෙල කිරීම මගින් තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉලක්ක සපුරාගැනීම පිළිබඳ ප්‍රගතිය අධීක්ෂණය සහ වාර්තා කිරීම සඳහා වැදගත් කර්තව්‍යක් ඉටු වන බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මහතා විසින් අවධාරණය කරන ලදී.

" ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අභිමතාර්ථ සහ දර්ශක පිළිබඳ තත්වය - 2017 " වාර්තාව මගින් තිරසර සංවර්ධන අභිමතාර්ථ 17 පිළිබඳව ද ඉලක්ක 160 සහ දර්ශක 244 පිළිබඳවත් දළ විශ්ලේෂණයක් සපයයි. එසේම මෙම වාර්තාවේ තිරසර සංවර්ධන දර්ශක පිළිබඳ ගෝලීය අර්ථ දැක්වීම් මෙන්ම ශ්‍රී ලංකාවේ දී යොදා ගන්නා අර්ථ දක්වීම් ඇතුලත් කොට ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා ජාතික සංඛ්‍යාලේඛන පද්ධතියට අදාල අනෙකුත් ආයතන විසින් කලින් කලට සම්පාදනය කරනු ලබන දත්ත උපයෝගී කොට ගනිමින් මෙම වාර්තාවේ අඩංගු තොරතුරු නොකඩවා යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලබන බවද ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මහතා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අභිමතාර්ථ සහ දර්ශක පිළිබඳ කාලීන තොරුතුරු ඇතුලත් වෙබ් අඩවියට ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය වන http://www.statistics.gov.lkහරහා පිවිසිය හැකි බවත් "ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන අභිමතාර්ථ සහ දර්ශක පිළිබඳ තත්වය - 2017" වාර්තාව ද එම වෙබ් අඩවිය ඔස්සේ ලබාගත හැකි බව ද ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය ඒ.ජේ.සතරසිංහ මහතා සඳහන් කළේ ය.

අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන් හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු මෙන්ම ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් එම්.අයි.එම්. රෆීක් මහතා ඇතුළු රජයේ නිලධාරීන් කිහිපදෙනෙක් ම මෙම උත්සවයට සහභාගී වූහ.

ආචාර්ය ඒ.ජේ. සතරසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

# STATUS OF SUSTAINABLE DEVELOPMENT GOALS INDICATORS IN SRI LANKA : 2017

unicef
for every child

Department of Census and Statistics
Ministry of National Policies and Economic Affairs, Sri Lanka